# ආසන්න බණ


දේශකයාණන් වහන්සේ
මීතිරිගල නිස්සරණ අරණ්‍ය සේනාසනයේ
අරණ්‍ය සේනාසනාධිපති,
**අතිපූජ්‍ය පානදුව ඛේමානන්ද හිමිපාණන් වහන්සේ**

# ආසන්න ධර්ම

දේශකයානන් වහන්සේ
මීතිරිගල නිස්සරණ අරණ්‍ය සේනාසනයේ
අරණ්‍ය සේනාසනාධිපති,
**අතිපූජ්‍ය පානදුව බේමානන්ද හිමිපාණන් වහන්සේ**

සංස්කාරක
**කිතුල් හිටියාවේ ධම්මගුත්ත ස්ථවිර**

ධර්ම දානය
සුපින්වත්
**අමරසිරි මහතා, මහත්මිය**
**සහ දරු පිරිස**

ප්‍රකාශනය
**මීතිරිගල නිස්සරණ වන සංරක්ෂණ මණ්ඩලය**

ධම්මදානය වශයෙන්

නොමිලයේ බෙදා හැරීම පිණිසයි

© මීතිරිගල නිස්සරණ වන සංරක්ෂණ මණ්ඩලය

ප්‍රථම මුද්‍රණය 1989
දෙවැනි මුද්‍රණය 2004
තෙවැනි මුද්‍රණය 2007

මුද්‍රණය

ලිතිර

306, ඇඹුල්දෙණිය, නුගේගොඩ.
දුරකථනය: 4921309

# පෙරවදන

අති පූජනීය පානදුව බේමානන්ද ස්වාමීන් වහන්සේ විසින් ප්‍රථමයෙන් ධර්ම දේශනාවක් ලෙසින් පවත්වන ලද මෙය පසුව "ආසන්න බණ" නමින් ධර්ම පුස්තකයක් ලෙසින් දෙවරක් මුද්‍රණය විය. එම ග්‍රන්ථ ධර්ම දානයක් ලෙසින් නොමිලයේ බෙදා දුන් අතර එහි ඇති වටිනාකම සලසා මෙලෙස තෙවැනි මුද්‍රණයක් ලෙසින් එළි දැක්වීමට මෙවර ඉදිරිපත් වී සිටින්නේ, අමරසිරි මැණියන් සහ අමරසිරි පියතුමාණන් විසිනි.

මේ කටයුතු සඳහා තම ආදරණීය දෙමාපියන් යොදවමින් තමනුත් බණ-භාවනා කටයුතු කරගෙන සිටින චිත්‍රානන්ද අමරසිරි මහතා මෙහි නියමුවාය.

මුද්‍රණ කටයුතු සෝබන ලෙස ඉටුකර දුන්නේ 'ලිතිර' හි ඇඹුල්දෙණිය මහත්මිය ඇතුළු එහි සේවක මණ්ඩලයයි.

මෙම ග්‍රන්ථය පූජනීය පානදුව බේමානන්ද ස්වාමීන් වහන්සේ අසාධ්‍යව රෝහල් ගතව සිටි අවසාන දින කීපය තුළ ඇඳලඟ සිටගෙන ස්වාමීන් වහන්සේට ඇසෙන්නට කියවීමි. එහි අදාලතාවය එහිදී මැනවින් ඒත්තු ගියේ ස්වාමීන් වහන්සේම ලියන ලද්ද, ස්වාමීන් වහන්සේම භාවනා කරන ලද්ද එම අවස්ථාවට එතරම්ම වැදගත් වූ නිසාය.

මේ සියලුදෙනාගේ සත්පුරුෂ ප්‍රයත්නයෙන් තෙවැනි මුද්‍රණයක් වශයෙන් එළි දක්වන මේ ග්‍රන්ථය, කියවන ඔබටත් මෙහි අන්තර්ගතය ප්‍රයෝජනවත් වේවා! එපින් බෙලෙන් අපවත් වී වදාල අපගේ ලොකු ස්වාමීන් වහන්සේට නිවන් සුව අත්වේවා! එසේම ධර්ම දානය පිණිස මුද්‍රණය කොට ලබාදෙන සත්පුරුෂ මණ්ඩලයත්, කියවන ඔබත් නිදුක් නිරෝගී සම්පත් කෙළවර අමා මහ නිවන් සාක්ෂාත් කරත්වායි! පතන්නේ මෛත්‍රියෙනි.

මෙයට මෙතැති
**උ. ධම්මජීව හිමි**
නිස්සරණ වනය
මීතිරිගල.

සැප් 30/2007

# පුණ්‍යානුමෝදනාව

අනේපිඬු සිටුතුමා දැඩිව ගිලන් වූ අවස්ථාවක, සැරියුත් මහරහතන් වහන්සේ විසින් දේශිත බුද්ධ වචනයකි. මෙම ග්‍රන්ථයට අදාල මාතෘකාව වී ඇත්තේ.

අතිපූජ්‍ය පානදුව ඛේමානන්ද හිමියන් විසින් දේශිත මෙම ධර්ම දේශනාව තෙවැනි වරට මුද්‍රණය කිරීමට තීරණය කළේ, මෙහි ඇති, වටිනාකම අවබෝධකර, ධර්ම දනය වශයෙන් බෙදා දීමටය. ලොකු ස්වාමීන් වහන්සේ ගිලන් වූ අවස්ථාවේදීත් උන්වහන්සේ විසින්ම රචිත මෙම ග්‍රන්ථය උන්වහන්සේට අසන්නට කියවීමේදී උන්වහන්සේගේ වේදනාව සමනයවී සෞම්‍යය තත්ත්වයට පත්වූ බව, අපට දැනගන්නට ලැබින.

කුඩා ග්‍රන්ථයක් වුවත්, කාහටත්, ප්‍රයෝජනයක් ගතහැකි වටිනා ධර්ම කාරණා වලින් යුක්ත වූ මෙය පරිශීලනය කොට සැනසිල්ලට පත්වේවා. යැයි අප මෛත්‍රීපූර්වකව ප්‍රාර්ථනා කරමු.

මෙම ග්‍රන්ථය නැවත මුද්‍රණය කිරීම මඟින් මෙම මහඟු ධර්මදානය කර ගැනීම සඳහා අපට අවසර දුන් ගරු උඩර්රියගම ධම්මජීව හිමිපාණන් වහන්සේ ඇතුළු නිස්සරණ වනයේ වැඩ වාසය කරන අතිකුත් සියලු ගරුකටයුතු ස්වාමීන් වහන්සේලාට තම තමන්ගේ ප්‍රාර්ථනා සමෘද්ධිමත් වී සීල සමාධි ප්‍රඥා වැඩී නිර්වාණ ධාතුව සාක්ශාත් වේවා! යි ඉත සිතින් ප්‍රාර්ථනා කරමු.

මෙම පිරිනමන ධර්මදනයේ කුසලානිසංශයේ බෙලෙන් අප දරු මුණුබුරන්ටත්, අපගේ නමින් පරලෝසැපත් දෙමාපියන් වහන්සේලාටත්, පරලොව ගිය ඥාතිමිත්‍රාදීන්ටත් සුගති සැප අජර-අමර අමා මහ නිවන් සුවය අත්වේවා!

මෙම වටිනා ග්‍රන්ථය මුද්‍රණය කිරීමට උපකාරී වූ සියළු දෙනාගේ සියළු ප්‍රාර්ථනා සමෘද්ධිමත් වේවා! නිවනින් සැනසේවා.

මෙයට,
ශාසනාලයැති
අමරසිරි මහතා මහත්මිය
සහ දරු පිරිස
2007-10-10

125/12,
පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

# ආසන්න ධණ

***නමො තසස භගවතො අරහතො***

***සමමා සමබුදධසස !!!***

**කමමං විජ්ජා ච ධමෙමා ච**

**සීලං ජීවිත මුතතමං**

**එහෙන මචචා සුජකධනති**

**න ගොතෙතන ධනෙන වා**

[ම: උපරි: සළායතන වගග 534]

අති පූජ්‍යතම ගෞරවනීය අප මහෝපාධ්‍යායන් වහන්සේගෙන් අවසරයි.! අද ධර්ම ශ්‍රවනය සඳහා රැස්ව සිටින ගරු සම්භාවනීය මහා සංඝරත්නය වෙත මේ ඉදිරිපත් කරන්නට යෙදුණේ අනාථ පිණ්ඩිකෝවාද සූත්‍රයෙහි සංග්‍රහවී ඇති ගාථාවකි. මෙය මජ්ඣිම නිකායේ එන්නකි. උපරි පණ්ණාසකයේ සළායතන වග්ගයේ එන්නකි. මෙය බුදුරජාණන් වහන්සේගේ බුද්ධ භාෂිතයක් වූද, ශ්‍රාවක භාෂිතයක් වූද, දේව භාෂිතයක් වූද සුමුහිරි ධර්ම දේශනාවකි.

ගිහි-පැවිදි හැම ශ්‍රාවකයෙකුටම ප්‍රයෝජන වත්වන මෙම ධර්මය දේශනා කිරීමට හේතු වූයේ අනේපිඬු සිටුතුමා දැඩිසේ ගිලන් වීම නිසා ඔහු විසින් බුදුරජාණන් වහන්සේට කරන ලද ආරාධනය නිසයි. මෙහි නිදාන කථාව විස්තර කිරීමට පෙර මාවිසින් මුලින් මාතෘකා කළ ගාථා ධර්මයේ කෙටි අර්ථය මුලින් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙමි.

මාර්ග චෙතනා සංඛ්‍යාත කර්මයද මාර්ග ප්‍රඥා සංඛ්‍යාත විද්‍යාවද, සමාධි පාක්ෂික ධර්මයද, සිල්වත්හුගේ ජීවිතයද උතුම් වෙයි. මේ එම ගාථාවේ කෙටි අදහසයි. දැන් අපි නිදාන කථාව සලකා බලමු.

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර දෙවුරම් වෙහෙර වැඩවසන සේක. එ සමයෙහි අනේපිඬු සිටුතුමා දැඩිසේ ගිලන්විය.

ඉක්බිති අනේපිඬු සිටුතුමාගේ අණ පරිදි එක්තරා පුරුෂයෙක් භාග්‍යවතුන් වහන්සේ කරා ගොස් වැඳ එකත්පස්ව හිඳ ගත්තේය. හිඳ "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! අනේපිඬු සිටුතුමා ආබාධිකව දුකට පැමිණියේ දැඩි සේ ගිලන් වූයේ වෙයි. හේ තෙමේ භාග්‍යවතුන් වහන්සේ ගේ පා සඟල හිසින් වඳිය"යි සැළ කළේය. යලි ආයුෂමත් සැරියුත් ස්වාමීන් වහන්සේ කරා එළැඹ ස්වාමීනි! අනේපිඬු සිටු තෙමේ ආබාධික වැ දුඃඛිත වැ දැඩිසේ ගිලන් වූයේ වෙයි, හේ තෙමේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ පා සඟල හිසින් වඳී"යි කියා වැඳ "ස්වාමීනි අනුකම්පා පිණිස අනේපිඬු සිටුහු ගේ නිවෙස්න කරා එළැඹෙන සේක්වා"යි ආරාධනා කෙළේය.

මරණ මඤ්චකයෙහි වැදහොත් අනේපිඬු සිටුතුමාගෙන් ලැබුණු ආරාධනාව පිළිගත් සැරියුත් ස්වාමීන් වහන්සේ හැඳ පෙරවැ පා සිවුරුගෙන ආනන්ද ස්වාමීන් වහන්සේත් සමඟ අනේපිඬු සිටුතුමාගේ නිවෙස කරා එළැඹියහ. එළැඹ සිටුතුමා සමීපයෙහි පැණ වූ අස්නෙහි වැඩහුන්සේක. වැඩ හිඳ "කිම ගෘහපතිය, ඔබට ඉවැසිය හැකිද, කිම යැපිය හැකිද, කිම ඔබගේ දුක් වේදනාවෝ අඩු නොවෙත්ද, නොවැඩෙත්ද, තනුභාවයාගේ අවසානය පැනේද, වැඩීම නොපැනේද'යි ඇසූහ.

එවිට මහ සිටාණෝ "ස්වාමීනි ශාරිපුත්‍රයන් වහන්ස, මට ඉවැසිය නොහැක්ක, යැපිය නොහැක්ක, මාගේ දුඃඛ වේදනාවෝ දැඩි වූවාහු බලවත් වෙති තුනී නොවෙත් වැඩීමේ අවසානය පැණෙයි. බැසීමේ අවසානය නොපැනේය"යි කීහ, එතුමා තමාගේ දුඃඛ වේදනා තව දුරටත් මෙසේ පැහැදිලි කරයි.

"ශාරීපුත්‍රයන් වහන්ස, බලවත් පුරුෂයෙක් තියුණු ආයුධයකින් සාරන්නාක් මෙන් අධිමාත්‍ර වූ වාතයෝ මාගේ හිස් මුදුන පෙළත්..... මට

ඉවැසිය නොහැක්ක.. බලවත් පුරුෂයෙක් මාගේ හිස වරපටෙකින් වෙළා දැතට අදිමින් පීඩා කරන්නාක් මෙන් අධි මාත්‍ර වූ වාතයෝ මාගේ හිසපෙළත්.. මට ඉවැසිය නොහැක්ක.. ස්වාමීනි හරක් මරන්නෙක් හෝ ඔහුගේ අතවැසියෙක් හෝ තියුණු වූ ගෙරින් කපන සැතෙකින් කුස සිඳින්නේද එසෙයින්ම අධිමාත්‍ර වූ වාතයෝ මාගේ කුස සිඳිති... ස්වාමීනි යම් සේ බලවත් පුරුෂයෝ දෙදෙනෙක් අතිශයින් දුර්වල වූ පුරුෂයකු වෙන වෙනම අත්ලා ගෙන ඒ මේ අත පෙරළමින් අඟුරු වළෙක්හි තවන්නාක්මෙන් අධිමාත්‍ර වූ මගේ ශරීර දාහය මට ඉවැසිය නොහැක්ක. මාගේ දැඩි වූ දුඃඛ වේදනාවෝ වැඩෙත් තුනී නොවෙත්"

මේ කථාව ඇසූ සැරියුත් ස්වාමීන් වහන්සේ "සිටුතුමාගේ මාරාන්තික වේදනාව හෝ මරණය හෝ වළක්වන්ට පුළුවන් කමක් නැහැ. එබැවින් අන් කථාවකින් ද ප්‍රයෝජනයක් නැහැ. ධර්ම කථාවක්ම කළ යුතුය"යි සිතා මෙසේ වදාළසේක.

අනේපිඬු සිටුතුමාට අවසන් වරට අසන්ට ලැබුණු මධුරතර ධර්ම දේශනාව මෙයයි. එසේම තමන් වහන්සේ කෙරෙහි අධිමාත්‍ර භක්තියෙන් උපස්ථාන කළ සිටුතුමාට සැරියුත් ස්වාමීන් වහන්සේ වදාළ අන්තිම අවවාද පද්ධතිය ද මෙයයි.

චක්ෂුරා දි ආයතන සය උපාදාන නොකළ යුතුයයි ප්‍රකාශ වන මේ පාළි ධර්මය විදර්ශනා වඩන, පෙළබස දත් යෝගාවචරයනට අමෘතයෙකි. අන්‍ය විහිත නොවැ සැදැහැයෙන් බණ අසන පාළි නොදත් පින්වතාගේ වුවද සිත, ධර්මාරම්මණයෙහි වහා සමාහිත වෙයි.

මේ දේශනාව අසමින් සිටයදී හෝ ඇසීමෙන් පසුවැ ආවර්ජනා කරන කල්හි හෝ ආයඞ මාර්ගාවබෝධය විය හැකිය. නැතහොත් ඒකාන්තයෙන්ම සුගති පරායණ වෙති. එබඳු මහත් අනුසස් ඇති මේ ධර්මය දැන් සිංහලෙන් දක්වනු ලැබේ.

1. ගෘහපතිය, ඔබගේ දුඃඛ වේදනාව ඔබට ඉවැසිය නොහැකි නම් යැපිය නොහැකි නම් චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මන යන අධ්‍යාත්මික ආයතනසය තණ්හාවෙන් මානයෙන් නොගනිමියි ඔබ විසින් හික්මිය යුතුය. මාගේ විඥ්ඥාණය ආධ්‍යාත්මික ආයතන සය

ආශ්‍රිත ද නොවේයයි තොප විසින් හික්මිය යුතුය. ගෘහපතිය, තොප විසින් මෙසේම හික්මිය යුතුය.

2. ගෘහපතිය, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම යන බාහිරායතන සය තෘෂ්ණාදීන් නොගනීමියි තොප විසින් හික්මිය යුතුය. මාගේ විඥානය බාහිර ආයතන සය ආශ්‍රිත ද නොවෙ යැයි තොප විසින් හික්මිය යුතුය. ගෘහපතිය තොප විසින් මෙසේම හික්මිය යුතුය.

3. ගෘහපතිය චක්ඛු විඤ්ඤාණාදි සවැදෑරුම් විඤ්ඤාණ කායතෘෂ්ණාදීන් නොගනිමියි තොප විසින් හික්මිය යුතුය. මාගේ විඤ්ඤාණය චක්ඛු විඤ්ඤාණාදී විඤ්ඤාණ සය ආශ්‍රිත ද නොවේයයි තොප විසින් හික්මිය යුතුය. ගෘහපතිය, තොප විසින් මෙසේම හික්මිය යුතුය.

4. ගෘහපතිය, චක්ෂුරාදි ස්පර්ශායතන සය තෘෂ්ණාදීන් නොගනිමියි තොප විසින් හික්මිය යුතුය. මාගේ විඤ්ඤාණය චක්ඛුසම්ඵස්සාදී ස්පර්ශායතන සය ආශ්‍රිත ද නොවේ යයි තොප විසින් හික්මිය යුතුය ගෘහපතිය, තොප විසින් මෙසේම හික්මිය යුතුය.

5. ගෘහපතිය, චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මන යන ආයතන සයගේ ස්පර්ශයෙන් උපන් වේදනා සය තෘෂ්ණාදීන් නොගනිමියි තොප විසින් හික්මිය යුතුය. මාගේ විඤ්ඥාණය චක්ඛුසම්ඵස්සආදි වේදනා සය ආශ්‍රිත ද නොවේයයි තොප විසින් හික්මිය යුතුය. ගෘහපතිය, තොප විසින් මෙසේම හික්මිය යුතුය.

6. ගෘහපතිය, පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාස, විඤ්ඤාණ යන ධාතු සය තෘෂ්ණාදීන් නොගනිමියි තොප විසින් හික්මිය යුතුය. මාගේ විඤ්ඤාණය පඨවි ආදී ධාතු සය ආශ්‍රිත ද නොවේ. යයි තොප විසින් හික්මිය යුතුය. ගෘහපතිය තොප විසින් මෙසේම හික්මිය යුතුය.

7. ගෘහපතිය, රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන පඤ්චස්-කන්ධය තෘෂ්ණාදීන් නොගනිමියි තොප විසින් හික්මිය යුතුය. මගේ විඤ්ඤාණය රූපාදී පඤ්චස්කන්ධය ආශ්‍රිත ද නොවේයයි තොප විසින් හික්මිය යුතුය, ගෘහපතිය, තොප විසින් මෙසේම හික්මිය යුතුය.

8. ගෘහපතිය, ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යන සතර ආරූප්‍යය තෘෂ්ණාදීන් නොගනිමියි තොප විසින් හික්මිය යුතුය. මාගේ විඤ්ඤාණය ආකාසානඤ්ඤායතනාදිය ආශ්‍රිතද නොවේයයි තොප විසින් හික්මිය යුතුය. ගෘහපතිය තොප විසින් මෙසේම හික්මිය යුතුය.

9. ගෘහපතිය, මේ ලෝකය හෝ පරලෝකය හෝ තෘෂ්ණාදීන් නොගනිමියි තොප විසින් හික්මිය යුතුය. මාගේ විඤ්ඤාණය මෙලොව හෝ පරලොව හෝ ආශ්‍රිත ද නොවේයයි තොප විසින් හික්මිය යුතුය. ගෘහපතිය, තොපවිසින් මෙසේම හික්මිය යුතුය.

10. ගෘහපතිය, ලැබූ සෙවූ සිතින් විමසූ යම් රූපායතනයෙක් ඇද්ද, ශබ්දායතනයෙක් ගන්ධායතනයෙක් රසායතනයෙක් ඵොට්ඨබ්බා යතනයෙක් ධර්මායතනයෙක් ඇද්ද එය තෘෂ්ණාදින් නොගනිමියි තොප විසින් හික්මිය යුතුය. මාගේ විඤ්ඤාණය ඒ රූපාදිය ඇසුරු නොකරන ලද වේයයි තොප විසින් හික්මිය යුතුය. ගෘහපතිය, තොප විසින් මෙසේම හික්මිය යුතුය.

සැරියුත් ස්වාමීන් වහන්සේ මෙසේ වදාළ කල්හි අනේපිඬු සිටුතුමා හැඬුවේය. කඳුළු හෙළුවේය. ඒ දුටු ආනන්ද ස්වාමීන් වහන්සේ ගෘහපතිය තොපි අරමුණෙහි ඇලෙයි ගැලෙයි කීහ.

ආනන්ද ස්වාමීන් වහන්සේ මෙසේ කීවේ සිටුතුමාට අවමන් කිරීමේ අදහසින් නොවෙයි. අවවාදය දැඩි කිරීම පිණිසයි. මෙහිදී ආනන්ද හාමුදුරුවෝ කල්පනා කළේ මේ සිටාණෝ බලවත් ශ්‍රද්ධාවන්තයෙක්. බුද්ධ ශාසනයෙහි අති ප්‍රසන්නයෙක්. එහෙත් මරණ බියෙන් බියපත්වී සිටිනවා ඔහු එසේ නම් මරණයට භය නොවන්නේ කවරෙක්ද කියයි.

ආනන්ද ස්වාමීන් වහන්සේ "සිටුතුමා අරමුණෙහි ඇලෙයි ගැලෙයි කී විට සිටුතුමා "වහන්ස ආනන්ද තෙරණුවෙනි, මම අරමුණෙහි නොඇලෙමි. නොගැලෙමි වැලී එකක් ඇති. මා විසින් දීර්ඝ කාලයක් ශාස්තෲන් වහන්සේ ඇසුරු කෙළෙමි. මනොභාවනීය භික්ෂූන් වහන්සේ ඇසුරු කළෙමි. මා විසින් මෙබඳු ධර්ම කථාවක් නොඇසූ විරූයැ"යි කීය.

පැවිද්දන්ට මිස සුදුරෙදි හඳින ගිහියන්ට මෙබඳු ධර්ම කථා නොවැටෙහන බව සැරියුත් ස්වාමීන් වහන්සේ වදාළසේක. එවිට සිටුතුමා "ස්වාමීනි, ධර්මය වටහා ගත හැකි ගිහියෝ ඇත්තාහ. ධර්මය නොඇසුව හොත් ඔහු පිරිහෙත්, එනිසා මෙබඳු ධර්ම කථා ගිහියන්ට ද සුදුසුය"යි කීය

ඉක්බිති සැරියුත් ස්වාමින් වහන්සේ කිසිත් නොබැණ හුනස්නෙන් නැගී ආනන්ද හිමියනුත් සමග විහාරයට වැඩම කළහ. එකෙණෙහිම වාගේ මහ සිටාණෝ කාළක්‍රියා කොට තුසිත දිව්‍ය ලෝකයෙහි උපන්හ

මෙසේ තුසිත භවනයෙහි උපන් අනාථපිණ්ඩික දෙව්පිත් තෙමේ රන්කඳක් මෙන් බබළන තුන්ගවු පමණ වූ තමාගේ දිව්‍යාත්මභාවය සහ උ්‍යාන විමානාදී මහා සම්පත් දැක, "මගේ සම්පත් අතිමහත්ය. මේසා මහත් සම්පත් ලැබීමට ම විසින් මිනිස් ලොවදී කුමන පින්කමක් කරන ලදදැයි බැලිය, බුද්ධාදී රත්නත්‍රය විෂයෙහි කරන ලද මහත් අධිකාරය දැක්කේය. දැක මෙසේ සිතන්ට විය "මේ දේවාත්මභාවය වනාහි පින්කම් කරගැනීමට අවකාස මඳ ප්‍රමාද ස්ථානයෙකි. මේ මහා සම්පත්තියෙහි සතුටු වන්නහුගේ සිහි මුළා වෙයි. එබැවින් මම දැන්ම මේ මොහොතෙහිම ජේතවනාරාමයට යන්නෙමි. ගොස් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි ජේතවනාරාමය ද තථාගතයන් වහන්සේ ද ආර්‍යමාර්ගය ද ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේද වර්ණනා කොට ගුණ කියා මගේ සන්තෝෂයද ප්‍රකාශ කරන්නෙමි. ඉක්බිති පෙරළා විත් දිව්‍ය සම්පත් අනුභව කරන්නෙමි."

මෙසේ සිතා එකෙණෙහිම මධ්‍යම රාත්‍රියෙහි තුසී පුරයෙන් නික්ම තමාගේ ශරීරාලෝකයෙන් මුළු දෙවුරව ම ආලෝක කරමින් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ එකත්පස්ව සිටියේය. සිටැ

1. **"ඉදං හි තං ජේතවනං**
   **ඉසිසංඝ නිසෙවිතං**
   **ආවුත්ථං ධම්මරාජේන**
   **පීතිසඤ්ජනනං මම**

2. **කම්මං විජ්ජාච ධම්මො ච**
**සීලං ජීවිතමුත්තමං,**
**එතෙන මච්චා සුජ්ක්ධන්ති**
**න ගොත්තෙන ධනෙනවා**

3. **තස්මා හි පණ්ඩිතො පොසො**
**සම්පස්සං අත්ථමත්තනො**
**යොනිසො විචිනෙ ධම්මං**
**එවං තත්ථ විසුජ්ක්ධති**

4. **සාරිපුත්තොච පඤ්ඤාය**
**සීලෙන උපසමෙන ච,**
**යොහි පාරගතො භික්ඛු**
**එතා ච පරමො සීයා"ති**

යන ගාථා කියා, "ශාස්තෲන් වහන්සේ මාගේ වචනය අනුදත් සේක"යි සතුටුව බුදුරජාණන් වහන්සේ වැඳ පැදකුණු කොට එහිම අතුරුදහන්විය. නොපෙනී ගියේය.

පසුදින බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා මේ සිද්ධිය ප්‍රකාශ කොට **"ඉදං හි තං ජෙතවනං"** යනාදි ගාථා සතරද වදාළ සේක. ඒ ඇසූ ආනන්ද ස්වාමීන් වහන්සේ "ස්වාමීනි, ඒකාන්තයෙන් ඒ අනේපිඬු දෙව්පිත් වන්නේය"යි කීහ බුදු රාජාණන් වහන්සේ සාදුකාර දී එය අනුමත කළ සේක.

## ගාථාවල තේරුම:-

1. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, භික්ෂු සංඝයා වහන්සේ සමග ධර්මරාජයන් වහන්සේ නිතර වැඩවාසය කරන මේ ජේතවනාරාමය මට ප්‍රිය උපදවන්නේය.

2. මාර්ග චේතනා සංඛ්‍යාත කර්මය ද, මාර්ග ප්‍රඥා සංඛ්‍යාත විද්‍යාවද, සමාධිපාක්ෂික ධර්මය ද, සිල්වත්හුගේ ජීවිතය ද උතුම් වෙයි, නොහොත් විජ්ජා සංඛ්‍යාත සම්මා දිට්ඨිය, සම්මා සංකප්පය, සීල සංඛ්‍යාත

සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීවය, යන මේ ආර්‍ය අෂ්ටාංගික මාර්ගයෙන් මනුෂ්‍යයෝ පිරිසිදු වෙති, ගෝත්‍රයෙන් හෝ ධනයෙන් පිරිසිදු නොවෙති.

3. එහෙයින් තම හට කැමති පණ්ඩිත පුරුෂ තෙමේ සමාධි පාක්ෂික ධර්මය නුවණින් විමසන්නේය. මෙසේ ඒ ආර්‍ය අෂ්ටාංගික මාර්ගයෙහි විශුද්ධිය වෙයි.

4. ප්‍රඥායෙන් ද ශීලයෙන් ද ක්ලේශොපසමයෙන් ද ශාරිපුත්‍රයන් වහන්සේම ශ්‍රේෂ්ඨ වෙති. නිර්වාණපාරයට පැමිණි යම් මහණෙක් වේද හෙතෙම ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පරම කොට ඇත්තේය.

## විස්තරය

මේ දේශනාව පිළිබඳ කරන විස්තරයේදී අනේපිඬු සිටුතුමා ගැනද එතුමාගේම පූජාවක් වූ ජේතවනාරාමය ගැනද විස්තර කළ යුතුය. එහෙත් ඒ ගැන නොදන්නා වූ කෙනෙක් ඇතැයි නොකිව හැකි තරමටම එය ප්‍රකට බැවින් මෙහි නොදක්වනු ලැබේ. එසේ වී නමුත් අනේපිඬු සිටුතුමාට මරණාසන්න කාලයෙහි ඇති වූ දුඃඛ වේදනාව අප විසින් අමතක කළයුතු නොවේ.

එතුමා වනාහි බුදුරජාණන් වහන්සේ නොදැකම "බුද්ධ" යන වචනය ඇසීම් මාත්‍රයෙන්ම බුදුරජාණන් වහන්සේ කෙරෙහි අභිප්‍රසන්න වූ උත්තමයෙක් පෘථග්ජන භූමියෙහි සිටියදී ඇති වූ ඒ ශ්‍රද්ධාව කොතරම් බලවත්ද කොතරම් ආශ්චර්‍යද? ඒ ශ්‍රද්ධාව කරණ කොට ගෙන එදා ඇතිවූ චිත්ත ප්‍රසාදය නිසා එදින රාත්‍රියෙහි වූ ඝනාන්ධකාරයද පහව ගියේය. එතුමාට පෙනී ගියේ ඒ රැය දවාල මෙනි එය එසේ නම් ආර්‍යශ්‍රාවකයකු වූ පසු එතුමාගේ ශ්‍රද්ධාව කොතරම් ආශ්චර්‍ය විය යුතු ද යනු නොසිතිය හැකිය. එය පුදුමයක් නොවේ. සිතන්න, ඇත්ත වශයෙන්ම ඔබත් අපත් මවිත විය යුත්තේ මරණාසන්න කාලයෙහි එතුමාට ඇතිවූ දුඃඛ වේදනාවේ බලවත් කම ගැනයි.

අනේපිඬු සිටුතුමා වැනි උතුමන්ටත් මරණාසන්නයෙහි එබඳු බලවත් දුඃඛ වේදනාවක් ඇතිවුනි නම් රෑ දවල් දෙක්හි පව්කම්හි ඇලී ගැලී වෙසෙන පුරුෂයෙකුට හෝ කල්‍යාණ පෘථග්ජනයකුට හෝ ඇති වන මරණ වේදනාව

කොතරම් දුඃඛදායක විය යුතුදැයි සිතිය යුතුය. සිතා සංවේගය උපදවා ගත යුතුය.

සැරියුත් ස්වාමීන් වහන්සේ අනේපිඩු සිටුතුමාට දී වදාළ අවවාද පද්ධතියේ පරමාර්ථය මරණ වේදනාව නැති කර ගැනීමයි. සුමිහිරි නිවන් සුවයෙන් සැනසෙනු කැමැති ගිහි පැවිදි සත් පුරුෂයන් විසින් ඒකාන්තයෙන් හික්මිය යුතු ඒ අවවාද පද්ධතිය චක්ඛුවෙන් ආරම්භ කොට නෙවසඤ්ඤානාසඤ්ඤායතනයද, ඉක්මවා අර්හත් ඵලයෙන් කුළුගන්වා තිබෙන සැටි කොතරම් විද්‍යාත්මකද? "ආශ්වාස ප්‍රශ්වාස වාතය හෙවත් හුස්ම ගැනීම පවා විද්‍යාවට එකඟදැයි සිතන, අභ්‍යාවකාශයේ නිවාස තැනීමට සැලසුම් කරන නවීන විද්‍යාඥයින්ගේ (විද්‍යා ගැත්තන්ගේ) මතැස ප්‍රවීණ විද්‍යාවට ද යොමු කරනු මැනවි. මේ ඊට කාලයයි

අධ්‍යාත්මික ආයතන සයය, බාහිරායතන සයය, විඤ්ඤාණ සයය ඵස්ස සයය, වේදනා සයය ධාතු සයය, ස්කන්ධ සයය, අරූපලෝක සතරය මෙලොවය, පරලොවය දිට්ඨය, සුතය, මුතය, විඤ්ඤතයැ"යි, හික්මිය යුතු ස්ථාන නොහොත් අවස්ථා පණස්එකක් මෙහි දක්වා තිබේ. මනා සිහියෙන් යුක්තවැ මේ දේශනාව ඇසූ කෙනෙකුට දිව්‍ය ලෝක සහ රූපි බ්‍රහ්මලෝක සඳහන් නොවීම ගැන ප්‍රශ්නයක් මතු විය හැකිය. මෙලොව හා පරලොව හරිහැටි තේරුම්ගත් විට ඒ සැකය සුණු විසුණු වී යයි.

මෙලොව වශයෙන් මනුෂ්‍යලෝකය ද පරලොව වශයෙන් මනුෂ්‍ය ලෝකය හැර දිව්‍යලෝක සයද රූපී බ්‍රහ්මලෝක දහසයද ගත යුතුයි. එසේ ගත් කල්හී මරණය නැති කිරීම සඳහා හික්මිය යුතු අවස්ථා තෙසැත්තෑවක් ලැබෙයි. මරණය නැති කිරීම නම් නිවන අවබෝධ කරගැනීමයි. සතර අපාය නො ගැනීම ගැනද විතර්ක කළ හැකිය. මරණාසන්නව සිටි කෙනෙකුට දැක්විය යුත්තේද ඇස්විය යුත්තේද සිත සතුටු කරවන ඉටු අරමුණු පමණයි. අනිටු අරමුණු ඉදිරිපත් කිරීම ඔහුට කරන ද්‍රෝහි කමෙකි. කොතරම් පව්කම් කළ කෙනෙකුට වුවත් මරණාසන්න කාලයෙහි (මොහොතෙහි) ඉටු අරමුණක් නොහොත් කුසල් අරමුණක් සිතින් ගත හැකි වුවහොත් ඔහුට අපායෙන් මිදිය හැකිය. අනේපිඬු සිටුතුමා සඳහටම අපායෙන් මිදුණු ආර්‍යශ්‍රාවකයෙකි. එබැවින් අපාය ගැන සඳහන් කිරීම

මෙවැනි අවස්ථාවක තබා අන් අවස්ථාවකට වත් නොගැලපෙන බව සැලකිය යුතු.

සැරියුත් ස්වාමීන් වහන්සේගේ අවවාද පද්ධතියෙහි ප්‍රථම ඡක්ක පඤ්චකයෙන් උගන්වා ඇත්තේ ඇස, කන, නැහැය, දිව, සිරුර සිත යන ඉන්ද්‍රිය සය සහ ඒ ඒ ඉන්ද්‍රියනට රූපාදි අරමුණු අපාථගත වීමෙන් උපදින විඤ්ඤාණ සයද ඒ සමගම ඇතිවන ස්පර්ශ සය සහ වේදනා සයද තණ්හාවෙන් හා මානයෙන් නොගත යුතු බවයි.

ඇසක් ඇසට අරමුණු වන රූපයත් ඒ දෙකේ ගැටුම නිසා උපදින විඤ්ඤාණය සහ ස්පර්ශයත් ස්පර්ශය නිසා උපදින වේදනාවක් යන ධර්ම පස තණ්හාවෙන් හෝ මානයෙන් හෝ ගැනීම උපාදානයයි. ඇසෙහි පහළ වන උපාදාන පස තේරුම් ගැනීමෙන් කන නැහැය ආදියෙහි පහළ උපාදාන වීමද තේරුම් ගත හැකිය, ඒ මෙසේ දත යුතු.

ඇසට රූපයක් ඉදිරිපත් වන විට අපට නොදැනෙන පරිදි ඒ දෙකෙහි එක්තරා සියුම් ගැටුමක් ඇති වෙයි. ඒ සමගම විඤ්ඤාණය හෙවත් අරමුණ දැනගන්නා වූ සිත උපදියි. ඒ සිතට චක්ඛු විඤ්ඤාණ යැයි කියත්, මුලින්ම කී ගැටුමට චක්ඛු සම්ඵස්සය (ස්පර්ශ) යි කියත් ස්පර්ශයක් සමග ඇතිවන්නේ අරමුණෙහි රස විඳීමේ ශක්තිය විශේෂයයි ඒ ශක්ති විශේෂය චක්ඛු සම්ඵස්සජ වේදනා නම්වේ.

මෙසේ ක්ෂණයක් පාසා උපදිමින් බිඳෙමින් සන්තති වශයෙන් පවත්නා වූ අජ්ජත්තික බාහිර රූප දෙකය, විඤ්ඤාණය ඵස්සය වේදනාවය කියන ධර්ම ස්වභාපස මමය කියා අස්මී මානයෙන් හා දිට්ඨියෙන් ද මාගේය කියා තණ්හාවෙන් ද ගැනීම උපාදානයයි. අනේපිඬු සිටුතුමා සෝවාන් පුද්ගලයකු බැවින් එතුමාට දිට්ඨිය නැත. දිට්ඨිය නම් මිත්‍යා දෘෂ්ඨියයි.

විඤ්ඤාණය ඵස්සය වේදනාවය යන මේ ධර්ම එකටම උපදින එකවරම නිරුද්ධ වන නාම ධර්ම සමූහයක් බව තේරුම් ගත යුතුය. විශේෂයෙන් මතක තබා ගතයුත්තේ මෙයින් එක් ධර්මයක් පමණක් එක් වරකට ප්‍රකට වන බවයි. එසේ ප්‍රකට වූ ධර්මය විඤ්ඤාණය හෝ ඵස්සය

හෝ වේදනාව හෝ වේවා එය තණ්හාවෙන් හෝ මානයෙන් හෝ දිට්ඨියෙන් හෝ ගත හොත් අන් ධර්මද ගත්තාහු වෙත්.

ඒ ප්‍රකට වූ ධර්මය අනිත්‍ය වශයෙන් හෝ දුක් වශයෙන් හෝ අශුභ වශයෙන් හෝ අනාත්ම වශයෙන් හෝ දැනෙන ආකාරයෙන් උපදින විටම මෙනෙහි කළහොත් තණ්හා, මාන, දිට්ඨී, විසින් ගැනීම නොවේ. උපාදානය නොකෙළේ වෙයි.

එසේ තණ්හාදීන් විසින් නොගැනීම නිසා දිට්ඨී සුත මුත විඤ්ඤාන මාත්‍රයෙහිම සිත පවත්නේය. එහි දිට්ඨී නම් දක්නා ලද්දයි. සුත නම් අසන ලද්දයි මුත නම් ඝාන ජිව්හා කාය යන ත්‍රිවිධ ද්වාරයන් කරණ කොට දන්නා ලද්දයි විඤ්ඤාන නම් මනසින් දන්නා ලද්දයි.

අර්හත් මාර්ගයට පැමිණී රහතන් වහන්සේගේ සිත ස්කන්ධ පරිනිර්වාණය දක්වාම රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, වේදනා, සංඥා, චේතනා, විඤ්ඤාණ, යන කිසිවක් තණ්හාදීන් විසින් නොගෙන දිට්ඨ, සුත, මුත, විඤ්ඤාණ, යන ක්‍රියා මාත්‍ර යෙහිම පවත්නේ වෙයි. එනිසා උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු මේ සත්ත්වයෙක පුද්ගලයෙක ආත්මයෙක යි ව්‍යවහාරයට යන ඇස, කන, නැහැය, දිව, සිරුර, මන යන කිසි අවයවයක් (ආයතනයක්) මතු පහළ වන්නේ ද නැත. එ බැවින් උන්වහන්සේ ආගිය අතක් මහත් සෘද්ධි ඇති මාරයාට ද නොදැක්ක හැකිය.

සත්ත්වයා උපදිමින් මැරෙමින් නැවත උපදිමින් සසර සැරිසරන්නේ ඇස් කන් නාසාදි ඉන්ද්‍රියයන් සහ ඒ ඉදුරන් පිනවන රූප ශබ්දාදී අරමුණු තණ්හා මාන දිට්ඨීන් විසින් ගැනීම නිසයි සසර දුක නැතිකර ගැනීමේ එකම උපාය වශයෙන් සැරියුත් ස්වාමීන් වහන්සේ පෙන්වා වදාළේ සදොරට හමුවන කිසි අරමුණක් උපාදානය නොකළයුතු බවයි. සැරියුත් ස්වාමීන් වහන්සේ මේ දේශනාවේදී සියවරකටත් වඩා "තොප විසින් මෙසේම හික්මිය යුතු"යයි තිර කොට වදාළේ සසර දුක හෙවත් ජරා මරණ නැති කිරීමට නොහොත් අජරාමර සංඛ්‍යාත අමෘත මහා නිර්වාන ධර්මය සාක්ෂාත් කරගැනීමට අන් උපායක් නැති නිසාමය.

මේ උපදේශය අනුව පිළිපැදීම නොහොත් හික්මීම නානප්‍රකාර කාම වස්තූන් ඇසුරු කරමින් ගිහි ගෙවල වාසය කරන අයට නොකළ හැකි බැවින් මෙබඳු ධර්ම කථා ගිහියන්ට නොදෙසන බව සැරියුත් ස්වාමීන් වහන්සේ අනේපිඬු සිටුතුමාට පෙන්වා දුන්හ. එසේ නම් මේ දේශනාව ඒකාන්තයෙන් පැවිද්දන්ටම සුදුසු බව පැවිද්දන් විසින් තරයේ සිතට ගත යුතුව ඇත. "ස්වාමිනි ධර්මය වටහාගත හැකි සුදුපිළි හදින ගිහියන් ඇති බවත් ධර්මය නොඇසුව හොත් ඔවුන් පිරිහෙන බවත් එනිසා මෙ බඳු ධර්ම කථා ගිහියන්ටද සුදුසුය"යි සිටුතුමා කී වචනය ගිහි පින්වතුන් විසින් සැලකිය යුතුය.

තමා සතු සියලු ගිහි සම්පත් හැරදමා **"සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ඡිකරණත්ථාය පබ්බාජෙථ මං භන්තෙ, අනුකම්පං උපාදාය"** යනුවෙන් යාච්ඤා කොට පැවිද්ද ලබාගත්තේ, ලබා ගන්නේ අන් කිසි කටයුත්තක් සඳහා නොවැ අවීචියෙහි පටන් භවාග්‍රය දක්වා ඇවිළගත් ජරා-මරණ නැමති මහා ගිනිකඳ නිවා ගැනීමේ ශ්‍රේෂ්ඨ ප්‍රතිපදාව වූ ශමථ-විදර්ශනා භාවනාවෙහි යෙදීම සඳහාය.

ජරා-මරණ ඇතිවීමේ හේතුව නොදන ජරා-මරණ නැතිකළ නොහැකිය. ජරා මරණ ඇතිවීමේ ළඟම හේතුව ජාතිය හෙවත් ඉපදීමයි. ඉපදීමට හේතුව භවයයි. භවය ඇතිවන්නේ උපාදාන හේතුවෙනි. උපාදානය නැති නම් භවයද නැත. භවය නැති නම් ජාතියද නැත. ජාතිය නැති නම් ජරා-මරණ- සෝක- පරිදේව- දුක්ඛ- දොමනස්ස- උපායාසද නැති එබැවින් ජරා-මරණ නැති කිරීමට නම් ජාතිය හෙවත් ඉපදීම නැති කළ යුතුය.

නූතන ලෝකයේ උගතුන් හෙවත් විද්‍යාඥයින් යැයි සම්මත ඇතැම් මෝඩයන් විසින් කරනු ලබන ගර්භාපාතනය, ගබ්සා කිරීම්, වඳ බෙහෙත්, වඳ සැත්කම්, උපත් සීමා, පවුල් සංවිධානය යනාදී විකාර වලින් ඉපදීම නැති කිරීමට සිතීම වනාහි ගංගා නම් ගඟ හිමාලය මුදුනට යැවීමේ අදහසින් මෝයට වැලි දැමීම වැනි පිස්සු වැඩකි.

ඉපදීම නැති කළ හැක්කේ ඉපදීමේ හේතුව නැති කිරීමෙනි, ඉපදීමේ හේතුව නැති කිරීමෙනි, ඉපදීමේ හේතුව භවයයි. එය කර්ම භව-උපපත්ති භවය කියා දෙවැදෑරුම් වෙයි. ප්‍රාණඝාතාදී දස අකුසල් හා දානාදී ලෞකික

කුසල් දසයද කර්ම භවයයි. ඒ ඒ කර්ම කළ නිසා ඇතිවන සත්ත්ව සන්තානයන්ට අයත් ස්කන්ධයන්ට උපපත්ති භවය යැයි කියත්. උපපත්ති භවය වශයෙන් සතර අපායද, දිව්‍යලෝක සයද රූපීබ්‍රහ්මලෝක දසයද අරූපීබ්‍රහ්මලෝක සතරද විස්තර කළ යුතුය.

"උපාදාන පච්චයා භවො"යි වදාළ පරිදි උපාදානය භවයට හේතුවෙයි. කාමුපාදානය, දිට්ඨුපාදානය, සීලබ්බතුපාදානය, අත්තවා දූපාදානයයයි උපාදාන සතරෙකි. අරමුණ තදින් ගැනීම කරන චෛතසික ධර්ම උපාදාන නම් වෙත්.

තමා ප්‍රිය කරන්නා වූ අඹු-දරු- නෑ- මිතුරු ආදී පුද්ගලයන් හා ඇත් -අස් ගව ආදී සතුන් ද, රන්, රිදී, මුතු- මැණික් -ඉඩ කඩම් -තිල- තල- ආදියද, යන මේවා මට ඕනෑමයයි තදින් අල්ලා ගන්නාවූ මිදවීමට පහසු නොවන පරිද්දෙන් නැවත නැවත ඇතිවීමෙන්, ඇති වී කලක් පැවතීමෙන් වැඩුණා වූ ලෝභය කාමුපාදානයයි. රූපාදි යම් කාමනීය වස්තුවක් නොහොත් කාම අරමුණක් ඇස කන නැහැය ආදි සදොරින් එක්තරා දොරකට අරමුණු වීම් වශයෙන් ඉදිරිපත් වුවහොත් රූපයක් ශබ්දයක් ආදි වශයෙන් එකෙණෙහිම මෙනෙහි කළ හැකි නම් ඒ අරමුණ උපදාන බවට නොපැමිණ, භවයට නොගොස්, භවෝත්තියටද හේතුවක් නොවී නිරුද්ධ වී යයි. අරමුණ මෙනෙහි කළ යුත්තේ තෘෂ්ණා මාන දිටඨියෙන් තොරවය. නුවණින්ම මෙනෙහි කළ යුතුය. එසේ මෙනෙහි කළ හැක්කේ එළඹ සිටි සිහි නුවණ ඇති අයට පමණයි. එසේ මෙනෙහි නොකොට ඒ අරමුණ නැවත නැවත සිතමින් ඇළුම් කළ හොත් උපාදාන බවට පත්වී වැඩෙනු ඇත.

එසේ වැඩී ශක්තිමත් වී සිත්හි මුල් බැස ගත් තෘෂ්ණා සංඛ්‍යාත උපාදානය ළපටි අවස්ථාවේදී ඇඟිලි දෙකින් අල්ලා උදුරා දැමිය හැකි පැලයක් වැඩී ලොකුවී මුල් බැස ගත් පසු "බුල්ඩෝසරයකින්" වුවත් අමාරුවෙන් උදුරා දැමිය යුතු මහ රුකක් මෙන් ශක්තිමත් වෙයි. දිට්ඨුපාදානාදි අනෙක් උපාදානයන්ගේ වැඩීමද මෙසේ යයි දත යුතු. එනිසා සසර බිය දක්නා යෝගාවචරයා අඛණ්ඩවූ සති සම්පජඤ්ඤයෙන් සියලු ඉරියවු පැවැත්විය යුතුය. ක්‍රියා කළ යුතුය. ආරම්භයේදී මෙය ටිකක් අපහසු

වැඩක් සේ දැනෙන්ට පුළුවනි. එසේ වුවත් පසුබට නොවී උත්සාහ කළ යුතුය. එසේ උත්සාහ කිරීමේදී ශ්‍රද්ධාව වීය්‍යීය ඉවැසීම අධිෂ්ඨානය ප්‍රීතිය පස්සද්ධිය එකග්ගතා යනාදී උසස් ධර්ම සමූහයකුත් සමග සිහිය හා නුවණද වැඩෙනු ඇත. එකලැ අනුභව කළ සැම ආහාරයක්ම ගලනාළය (උගුර) ස්පර්ශ කරමින්ම පහළට බැස යන්නාක් මෙන් සදොරට ආපාථගත වන සැම අරමුණක්ම සතියෙහි පහස ලබමින්, නුවණින් දැන ගනිමින් ම ගෙවීයන සැටි තමාටම දැකිය හැකිය.

උපාදානයට ප්‍රත්‍ය (හේතුව) වන්නේ වැඩීමෙන් බලවත් වූ තෘෂ්ණාවයි. චක්ෂුරාදි කිසියම් ඉන්ද්‍රියයකට රූපාදී අරමුණක් හමු වූ කෙණෙහිම නුවණින් මෙනෙහි කළ හොත් උපදානය නොවන බව යට සඳහන් කෙළෙමු.

දිට්ඨුපාදාන සීලබ්බතුපාදාන අත්තවාදූපාදාන යන තුන අරමුණ සිතට ගන්නා ආකාර වශයෙන් තුනක් වුවත් ධර්ම වශයෙන් එකයි. ඒ මෙසේ දතයුතු. දිට්ඨිය හෙවත් දර්ශනය සම්මාදිට්ඨි මිච්ඡාදිට්ඨි වශයෙන් දෙකකි. මෙහි දිට්ඨිය නම් මිත්‍යා දෘෂ්ඨියයි. අරමුණ වැරදි ලෙස දැකීම හා ඇති දෙය නැති හැටියටත් නැති දෙය ඇති හැටියටත් දැකීම මිථ්‍යා දෘෂ්ටියයි. සත්ත්වයෙක් පුද්ගලයෙක් ආත්මයක් නොවූ පඤ්චස්කන්ධය මමය, මාගේ ආත්මයය කියා ගැනීම අත්තවාදූපාදාන නමැති මිථ්‍යාදෘෂ්ටි සැට දෙකක් දක්වා තිබේ. ඒ හැර තවත් බරපතල දිට්ඨියක් තිබෙනවා. එනම් සක්කාය දිට්ඨියයි අන් සියලුම දිට්ඨි සක්කාය දිට්ඨිය මුල් කොට ඇති වී තිබේ. සක්කාය දිට්ඨිය යනු ආත්මයක් ඇතය කියාගත් වැරදි දිට්ඨිය තදින් ගැනීමයි. අත්තවාදූපාදානය කීවත් මේ සක්කාය දිට්ඨියමැයි. ස්වකාය හෙවත් පඤ්චස්කන්ධය තමාගේයයි සිතාගත් වැරදි දැකීම නම් වූ සක්කාය දිට්ඨිය දුරුකරගත හොත් සියලු මිත්‍යාදෘෂ්ටිහු හිරු දුටු අඳුරුමෙන් පහවයෙත්.

විදර්ශනා වඩන යෝගාවචරයා යම් මොහොතක නාම-රූප පරිච්ඡේද ඤාණය ලැබැ ගත්තෙහි නම් ඒ සමගම සක්කාය දිට්ඨිය තදඞ්ග වශයෙන් පහවී යයි. ලෞකික විදර්ශනා ඥාන වශයෙන් ලැබූ නාම-රූප පරිච්ඡේද ඤාණයෙහිද මහත් අනුසස් රැසක් ඇති බව විශුද්ධි මාර්ගය කියයි. සෝවාන් මගින් නැති වන සක්කාය දිට්ඨිය නැවත ඇතිනොවේ.

ඒකාන්තයෙන් නිවනට පමුණුවන්නා වූ සම්බුද්ධ ධර්මය නොඇසූ-වා වූද අසාත් පිළිනොගත්තා වූද ඇතැම් කෙනෙක් පරම විශුද්ධිය වූ නිවන හෝ දේවත්වය හෝ බ්‍රහ්මත්වය හෝ මේ සීලයෙන්ම ලැබ ගත හැකියයි වරදවා සිතා ගෙන ගවයකු මෙන් හැසිරෙන ගෝව්‍රත නම් ශීලයක් රැක අපාගතවූහ. ඇතැම් කෙනෙක් බල්ලකු මෙන් හැසිරෙන කුක්කුර ව්‍රත නම් ශීලයක් රැක අපාගතවූහ. තවත් කෙනෙක් එළුවකු මෙන් හැසිරෙන අජ ව්‍රත නම් ශීලයක් රැක අපාගත වූහ. මරණින් මතු අපාගත වන බව නොදන මෙයින්ම පරම විශුද්ධිය වේය'යි ගෝ ව්‍රතාදිය තදින් ගැනීම, සීලබ්බතුපාදාන නම් වේ.

ඇතැම් කෙනකුට ජාතිය, ගෝත්‍රය, නිරෝගිකම, පිරිවර, බහුශ්‍රැතබව රාත්‍රඥ බව, ආයුෂය, ශීලය, පිණ්ඩපාතිකාදී ධුතංග, ධ්‍යාන, ශාන්ත ඉරියව් ආදී නොයෙක් කරුණු නිසා මානය ඇතිවෙයි. මම මේ මේ කාරණයෙන් අන්‍යයාට වඩා උසස් වෙමි. පහත් වෙමි. සම වෙමි යන හැඟීමද මානයයි. මානය ඇතිවූවහුට එය උපාදාන වශයෙන් තදින් ගැනීම නම් වූ ක්ලේශය ඇතිවෙයි. මද ප්‍රමාද වශයෙන් දක්වෙන්නේද මානය මැයි. මානය සුලුපටු ක්ලේශයක් නොවේ. රහත්වීම දක්වාම පවත්වන්නේය. මානය ඇති තැන සති-සම්පජඤ්ඤ නැත.

සිය සිත් සතන්හි මානය ඇති බව දන එය තදංග වශයෙන් හෝ යටපත් කර නොගෙන කොතෙක් වීර්‍ය්‍ය කළත් භාවනා දියුණුවන්නේ නැත. රහත් මගින් නැතිවන්නේ මාන අනුසයයි. සිහි නුවණ යොදා අරමුණ මෙනෙහි කරන යෝගාවචරයාගේ මානය ක්‍රමයෙන් හීන් වී ගොස් අර්හත් මාර්ගඥානය ලැබෙන විට සහමුලින්ම නැතිවෙයි.

රහත්වීමේ අදහසින් විදර්ශනා වඩන යෝගාවචර තුමා ආරම්භයේ සිටම මානයෙන් තෙරවැ රහතන් වහන්සේ කෙනකුන් මෙන් සිහියෙන් යුක්තව ශාන්තව ඉරියවු පවත්වමින් සිත හික්මීම පුරුදු කළ යුතුය. රහතන් වහන්සේ රහත් වූයේ යම් පිළිවෙතක් අනුගමනය කොටද ඒ පිළිවෙත මමද අනුගමනය කරන්නෙමි. මම අද පටන් ඒ රහතන් වහන්සේට අනුව ජීවත් වන්නෙමි. මම අද පටන් ඒ රහතන් වහන්සේට අනුව ජීවත් වන්නෙමියි යන අදහස සිත තබාගත යුතුය. රහත්වීමේ පිළිවෙතහි ප්‍රමුඛත්වය දරනුයේ අඛණ්ඩවූ සතිය හා සම්පජඤ්ඤයයි.

මෙහි උපාදානය නොකළ යුතුයයි දක්වූ ධර්ම තෙසැත්තෑව දුක්ඛ සත්‍යය කියාද ඒ ධර්ම සමූහය උපාදානය කරන්නාවූ තෘෂ්ණාව සමුදය සත්‍යය කියාද, දුක්ඛ සමුදය දෙකෙහි ක්ෂනික නිරෝධය නිරොධ සත්‍ය කියාද, දුක දැන ගැනීම සඳහාද සමුදය පහකිරීම සඳහාද නිරෝධය ප්‍රත්‍යක්ෂ කිරීම සඳහාද නුවණ වැඩීම හෙවත් භාවනා කිරීම මාර්ග සත්‍යය කියාද දත යුතු.

බුද්ධි භාෂිත වූද ශ්‍රාවක භාෂිත වූද  දේව භාෂිත වූද මේ සුමිහිරි ධර්මය ඇසීමෙන් ජනිත වූ මහා පුණ්‍ය සම්පත්තිය පින්වත් ඔබට නිවන් සැප ලැබීම පිණිසම හේතු වේවා, වාසනාවේවා සියලු අපල උපද්‍රව දුරුවී බොහෝ කාලයක් සුවසේ ජීවත් වේවා!.

*සියලු සත්ත්වයෝ සුමිහිරි නිවන් සුවයෙන් සුවපත් වෙත්වා!*

Lithira